by Col. V. S Kudaligama

විදේශ ශිෂ්‍යත්වයන් ද දිනාගෙන ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් ලන්ඩන් වැනි ලෝපතල උසස් විද්‍යායතනවලට ඇතුළු වී විශිෂ්ට සාමාර්ථයන් ලැබ ආපසු පැමිණ කීර්තිමත් රාජ්‍ය තාන්ත්‍රිකයන්, අර්ථ ශාස්ත්‍රඥයන්, වෛද්‍යවරුන්, නීති වේදීන්, තාක්ෂණවේදීන් වශයෙන් මාතෘ භූමිය වෙනුවෙන් උදාර සේවාවන් ඉටු කළහ.

පී. ද ඇස්. කුලරත්න මහතා සමග බෞද්ධ අධ්‍යාපනය හා දේශීය සංස්කෘතිය නඟා සිටුවීමේ කාර්යයෙහි නිරත වෙමින් ආනන්ද විද්‍යාලයේ ආචාර්යවරයෙකු වශයෙන් ද සේවය කළ ජී. පී. මලලසේකර මහතා (පසුව ලංකා විශ්ව විද්‍යාලයයේ පෙරදිග භාෂා පිළිබඳ මහාචාර්ය) 1923 වර්ෂයේ දී අනුග්‍රාහක විදුහල්පති වශයෙන් සේවය කළේය. ආනන්ද අධ්‍යාපන පරිසරය සකස් කිරීමේ දී කුලරත්න මහතාට මලලසේකර මහතාගෙන් ලැබුණු අනුග්‍රහය සදනුස්මරණීය වෙයි.

විසි වැනි සියවසේ තෘතීය දශකය ආනන්ද ශතකයේ තවත් වැදගත් සන්ධිස්ථානයකි. වර්ධා අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාතෘ මහත්මා ගන්ධිතුමාත් සෞන්දර්ය අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාතෘ මහා කවි රබීන්ද්‍රනාත් ඨාගෝර් තුමාත් ශ්‍රේෂ්ඨ තම කිවිදියක වූ සරෝජිණී නායිදූ පණ්ඩිත මැතිණියත් ආනන්ද විද්‍යාලයට පැමිණ අධ්‍යාපන හා සංස්කෘතිය පිළිබඳවත් ආසියාවේ නිදහස් සටන පිළිබඳවත් අදහස් ප්‍රකාශ කළේ මෙම දශකය තුළ දී ය. මහත්මා ගන්ධි තුමාගේ හා රබීන්ද්‍රනාත් ඨාගෝර් තුමාගේ අධ්‍යාපන දර්ශන පිළිබඳව කුලරත්න මහතාත් මලලසේකර මහතාත් සැලකිල්ලක් දැක්වූහ.

1923 මැයි මාසයේ දී ලංකාවට පැමිණි මහාකවි රබීන්ද්‍රනාත් ඨාගෝර් තුමා ආනන්ද විද්‍යාලයයේ ත්‍යාග ප්‍රදානෝත්සව යකට සහභාගි වෙමින් කළ කථාව එතුමාගේ අධ්‍යාපන දර්ශනය මැනවින් පිළිබිඹු කරන්නක් විය. **‘අද දින ගුරුවරු හෙට හා ඊළඟට එන අවධියේ සමාජයේ ඉරණම පිළිබඳ වගකිව යුත්තෝයි· ලෝකයේ විවිධ රටවල ඉරණම මෙන්ම එකිනෙක රටවල අන්‍යොන්‍ය මිත්‍රත්වය ඇතිවන්නේ ඒ රටවල ජනයා පුහුණු කළ විධියට ය. ඔවුන් තුළ තහවුරු කළ පරමාර්ථ අනුවය. ඔවුන් තුළ සංවර්ධනය කළ චරිතවල හැටියටය. ඔවුනට ලබා දෙන දැනීමේ හැටියටය. ඔවුන් හික්ම වූ පිළිවෙල අනුවය. ඔවුන්ගේ සිත පුහුණු කළ ක්‍රම අනුවය’** යනුවෙන් දැක්වූ ඨාගෝර් තුමාගේ අධ්‍යාපන පරමාර්ථවලින් සමහරක් අතීතයේ ක්‍රම විප්ලවකාරි ලෙස වෙනස් කිරීම ය. මෙයින් අපට පෙනී යන්නේ අධ්‍යාපනික ඉලක්කය හරි නම් අධ්‍යාපන පරමාර්ථ හා රටාව සංවර්ධනය කිරීමට කුලරත්න මහතා බඳු ආභාසයක් ලබාදිය හැකි පුද්ගලයන් සිටී නම් සෑම තනි පුද්ගලයාම දියුණු කළ හැකිය යන විශ්වාසය සම්පූර්ණ යෙන් ම නිවැරදි බවය.

සෞන්දර්යවාදියකු වන් ඨාගෝර් තුමා විශ්වාස කළේ; අධ්‍යාපනයෙන් ළමයා තුළ ස්වභාවධර්මය හා සම්බන්ධ වූ පෞරුෂත්වයක් වර්ධනය කිරීම හා ළමයා ස්වභාව ධර්මය හා සමබර ලෙස සංවර්ධනය කිරීමය. ළමයා ස්වභාව ධර්මයේ සුන්දරත්වය උරාගැනීම ඨාගෝර්තුමාට අවශ්‍ය විය. ගගන තලයේ පැතිරීමත්, සන්ධ්‍යාවේ නිශ්චල භාවයත්, අරුණෝදයේ බලාපොරොත්තු සහගත බවත්, තාරකාවන්ගේ ලීලෝපේත කාන්තියත්, සූර්යාගේ ජ්වලිත භාවයත් ළමයාගේ පෞද්ගලිකත්වය ඔප්නැංවීමට උදවකර ගැනීම ඔහුට අවශ්‍ය විය. ඔහුට සෞන්දර්යය වනාහී ගුණධර්මයකි. ගුණධර්ම ... ැද්දිය යුත්තේ සෞන්දර්යයේ ආත්මයෙනි. මේ ආකාරයට ඔහුගේ අධ්‍යාපන පරමාර්ථ වලට සහයෝග කරන්නට අවශ්‍ය වූයේ සත්‍යය, සෞන්දර් යය හා ගුණ යහපත්කම් යන අගයන්ය. ඨාගෝර් තුමා 1901 දී ඔහුගේ පළමුවන පාඨශාලාව හැටියට ශාන්ති නිකේතනය ශිෂ්‍යයන් තිදෙනෙකුගෙන් ආරම්භ කළේ එම අධ්‍යාපන පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහාය. රබීන්ද්‍රනාත් ඨාගෝර් තුමාගේ ආනන්දගමනයෙන් පසු ආදි ආනන්දීයයන් ගෙන් ඇතැම් කෙනෙක් ශාන්ති නිකේතනයේ සෞන්දර්ය අධ්‍යාපනය ලැබූහ.

මෙසේ පෙර අපර දෙදිග ප්‍රාඥයන්ගේ ආභාසය ද ලැබ විශ්ව සාධාරණ එහෙත් දේශීය ලක්ෂණයෙන් හෙබි ප්‍රබුද්ධ (බෞද්ධ) අධ්‍යාපන සහන් එළියක ආනන්දයෙන් ආනන්ද දරුවෝ පෙරමුණ ගත්හ.

පී. ද. ඇස්. කුලරත්න මහතා ගේ ආනන්ද සේවයෙන් පසු—1943 දී **ඒ. බී. පෙරේරා මහතා** විදුහල්පති ධුරය භාර ගත්තේ ය. ඔහුගේ අවුරුදු දෙකක් පමණ වූ සේවා කාලය ආනන්දයේ උදාර පැවැත්මට පිටුබලයක් විය. අටලෝ දහමේ බලපෑම ආනන්දයට පමණක් අවිෂය වූවක් නොවේ. එහෙත් ආනන්දලෝකය කළඹාලා පළවාහැර වහා නැගෙන්-නට විය.

**ඇල්. එච්. මෙත්තානන්ද** මහතා 1945 නොවැම්බර් 1 වැනි ද ආනන්ද විද්‍යාලයයේ අධිපති පදවිය භාර ගත්තේ ය. 1936 සිට 1945 අග භාගය දක්වා මහනුවර ධර්මරාජ විද්‍යාලය යේ අධිපති පදවිය දැරූ මෙත්තානන්ද මහතා ඊට පෙර ආනන්දයේ ආචාර්යවරයකු වශයෙන් සේවය කළේය. ප්‍රතිභා සම්පන්න ආචාර්යවරයකු වශයෙන් ආනන්ද විද්‍යාලය යේ දී ඔහු අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳව මහත් සැලකිල්ලක් දක්වන්නට විය. ග්‍රන්ථ ඥානයටත් වඩා පන්ති කාමරයේ දී ගුරුවරයෙකුට ලැබෙන අත්දැකීම් අධ්‍යාපන මනෝවිද්‍යාවේ පදනම විය යුතු යයි ඔහුට පෙනී ගියේය. පශ්චාත් උපාධි සඳහා එංගලන්තයට ගිය මෙත්තානන්ද මහතා එහි දී ආචාර්ය සිරිල් බර්ට්, ආචාර්ය ස්පියර්මන් වැනි අධ්‍යාපන විශාරදයින් ඇසුරින් මනෝවිද්‍යාවත් අධ්‍යාපන විද්‍යාවත් මැනවින් හදරා සිය රටට පැමිණ ආනන්දයේ ආචාර්යවරයකු වශයෙන් යළිත් සේවය කරන්නට පටන් ගත්තේ ය.

අධ්‍යාපන විද්‍යාව සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තුළ අත් දැක බැසගත් නිගමනයන් මෙත්තානන්ද මහතා ප්‍රසිද්ධි යේ ප්‍රකාශ කළේ ආනන්ද විද්‍යාලයයේ අධිපති ධුරය දරමින් සිටිය දීය. ලෝක මහා සංග්‍රාමයෙන් පසු කාලයෙහි ව්‍යාකූල ස්වරූපයක් දැරූ ආනන්දය, නැවත ශාන්ත ශීලී ප්‍රබුද්ධ තත්ත්වයට පැමිණවීමට මේ ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයා ගේ නායකත්වය අපූර්ව බලවේගයක් විය. සැණකෙළි සල්පිල් පැවැත්වීමෙන් හා ත්‍යාගශීලී ධනවතුන් හමු වී කතා බස් කිරීමෙන් නොමසුරු ආධාර ලබාගෙන විද්‍යාලය නවාංග සම්පූර්ණ තැනක් කිරීමට සෑම උත්සාහයක් ම දැරුවේය. ඉඩ ලත් අවස්ථාවන් හි දී අධ්‍යාපන අර්බුදය විසඳගත යුතු විධි පුවත් පත් මගින් සාකච්ඡා කළේය. පුද්ගලයකුගේ ආර්ථික ශක්තිය සහ ඔහු සමාජයේ උසුලන තත්ත්වය යන කාරණාවන් කෙබඳු වුවත් ඔහු තුළ කිසියම් හපන් කමක් ඇත්නම් එය හඳුනා ගත හැකි වන ලෙසත්, හඳුනාගෙන වැඩි දියුණු කරගත හැකි වන ලෙසත් අධ්‍යාපන සැලැස්ම සූදනම් කළ යුතුයයි මෙත්තානන්ද මහතා කීවේය.